# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1319/34 - 2003 දෙසැම්බර් 19 වැනි සිකුරාදා - 2003.12.19

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.බී. 21/78.

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 27 (1) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තෘතියික අධ්‍යාපන හා පුහුණු කටයුතු අමාත්‍ය කබීර් හෂීම් වන මා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර මේ පනතේ කාර්ය සඳහා විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු (මෙහි මින් මතු "අදාළ නියමය" යනුවෙන් හඳුන්වනු ලබන) පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා සම්බන්ධ උද්දේශික නියමයේ උපලේඛනය, මේ නියමය මගින් කෘෂිකර්ම පීඨය හා ඒ පීඨය සංයුක්ත වන්නාවූ අධ්‍යයන අංශ වෙනුවට මෙහි උපලේඛනයේ දක්වා ඇති පීඨය හා අධ්‍යයන අංශ ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

කබීර් හෂීම්,
තෘතියික අධ්‍යාපන සහ පුහුණු කටයුතු පිළිබඳ අමාත්‍ය.

2003 දෙසැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| කෘෂිකර්ම පීඨය | බෝග විද්‍යා අධ්‍යයන අංශය ;<br>කෘෂි ඉංජිනේරු අධ්‍යයන අංශය ;<br>කෘෂි ජීව විද්‍යා අධ්‍යයන අංශය ;<br>පාංශු විද්‍යා අධ්‍යයන අංශය ;<br>ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය ;<br>කෘෂි ආර්ථික විද්‍යා හා ව්‍යාපාර කළමනාකරණය අධ්‍යයන අංශය ;<br>කෘෂි ව්‍යාප්ති අධ්‍යයන අංශය ;<br>සත්ත්ව පාලන අධ්‍යයන අංශය. |

01-231


1A - G 003487- 1,040 (2003/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.